**ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය**

**පුරප්පාඩු**

මෙම විශ්වවිද්‍යාලයේ පුරප්පාඩුව පවතින පහත සඳහන් තනතුරු සඳහා සුදුසුකම් සහිත අයදුම්කරුවන්ගෙන් 2025.04.25 දින දක්වා අයදුම්පත් කැඳවනු ලැබේ.

## 01. තාක්ෂණික නිලධාරි (තොරතුරු හා සන්නිවේදන තාක්ෂණික) III ශ්‍රේණිය

**අවශ්‍ය සුදුසුකම්** : (i) ඕනෑම විෂය ධාරාවකින් අ.පො.ස. (උ.පෙළ) විභාගයේ දී විෂයයන් තුනක් (03) සමත් විය යුතුය.

**සහ**

(ii). තෘතීක හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව මඟින් පිළිගත් කාර්මික/ වෘත්තීය පුහුණු ආයතනයක් විසින් හෝ තොරතුරු සන්නිවේදනය හා බහු මාධ්‍ය තාක්ෂණය/ තොරතුරු සන්නිවේදන තාක්ෂණය/ තොරතුරු තාක්ෂණය යන ක්ෂේත්‍රයකට අදාළව පිළිගත් ආයතනයක් විසින් නිකුත් කරනු ලැබූ N.V.Q. 5 වෙනි මට්ටමට නොඅඩු නිපුනතා සහතිකපත් හෝ වෙනත් සමාන සුදුසුකමක් ලබා තිබීම.

- තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයට අදාළ රැකියා පළපුරුද්දක් සහිත අයදුම්කරුවන් කෙරෙහි විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.

**වයස** : අයදුම්පත් බාර ගන්නා අවසන් දිනට අවුරුදු 18ට නො අඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

**තෝරා ගැනීම** : ලිඛිත හා/ හෝ ප්‍රයෝගික පරීක්ෂණයක් හා සම්මුඛ පරීක්ෂණයක් මඟින්

**වැටුප් පරිමාණය** : UMT 1(III)
රු. 51,095 - 7x540 ; 10 x 640 – 60,575/= (මාසික)

**02. තාක්ෂණික නිලධාරි (ශ්‍රව්‍ය දෘෂ්‍ය) III ශ්‍රේණිය**

**අවශ්‍ය සුදුසුකම්** : (i) ඕනෑම විෂය ධාරාවකින් අ.පො.ස. (උ.පෙළ) විභාගයේ දී විෂයයන් තුනක් (03) සමත් විය යුතුය.

සහ

(ii) අ) තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් හෝ පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද පනතක් මඟින් ස්ථාපිත කරන ලද ව්‍යවස්ථාපිත ආයතනයකින් ඉලොක්ට්‍රොනික සහ විදුලි සංදේශ / ඉලෙක්ට්‍රොනික/ බහු මාධ්‍ය හෝ ශ්‍රව්‍ය දෘෂ්‍ය තාක්ෂණ ක්ෂේත්‍රයේ N.V.Q. 5 අදියරට නො අඩු නිපුණතා සහතිකයක් ලබා තිබීම.

හෝ

ආ) තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් ඉහත (ii) (අ) සුදුසුකම්වලට සමාන ලෙස පිළිගත් ඉලෙක්ට්‍රොනික හා විදුලි සංදේශ ඉලෙක්ට්‍රොනික /බහුමාධ්‍ය හෝ ශ්‍රව්‍ය දෘෂ්‍ය තාක්ෂණ ක්ෂේත්‍රයේ තාක්ෂණික සුදුසුකම් ලබා තිබීම සහ පිළිගත් ආයතනයක ශ්‍රව්‍ය දෘෂ්‍ය කටයුතු පිළිබඳ වසරක පළපුරුද්ද

**වයස:** අයදුම්පත් බාරගන්නා අවසන් දිනට අවුරුදු 18 ට නො අඩු සහ 45 ට නොවැඩි විය යුතුය.

**තෝරා ගැනීම:** ලිඛිත හා / හෝ ප්‍රායෝගික පරීක්ෂණයක් සහ සම්මුඛ පරීක්ෂණයක් මඟිනි

**වැටුප් පරිමාණය:** UMT 1(III)
රු. 51,095 – 7 x 540 ; 10x640 – 60,575/= (මාසික)

## 03. කළමනාකරණ සහකාර III ශ්‍රේණිය

**අවශ්‍ය සුදුසුකම් :**

1. අ.පො.ස. (සා.පෙළ) විභාගයේ
   i. සිංහල භාෂාව/ දෙමළ භාෂාව
   ii. ඉංග්‍රීසි භාෂාව/ ඉංග්‍රීසි සාහිත්‍යය
   iii. ගණිතය

   යන විෂයයන්ට සම්මාන සාමාර්ථ සහිතව විෂයයන් හයක් එක් වරක දී සමත් වී තිබීම.

   **සහ**

2. අ.පො.ස. (උ.පෙළ) විභාගය එක් වරක දී සියලු විෂයයන් සමත්වීම. (සාමාන්‍ය පොදු පරීක්ෂණ ප්‍රශ්න පත්‍රය හැර)
   (පැරණි විෂය නිර්දේශ යටතේ එක් වරක දී විෂයයන් තුනක් සමත් වී තිබීම ප්‍රමාණවත් වනු ඇත.)

3. පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති අය කෙරෙහි ප්‍රමුඛතාවයක් දක්වනු ලැබේ.

   (අ). පිළිගත් ආයතනයකින් ලබාගත් මාස 06 කට නොඅඩු පරිගණක යෙදුම් භාවිතය පිළිබඳ සුදුසුකම්

   **සහ**

   (ආ). පරිගණක යෙදුම් පැකේජ භාවිතය පිළිබඳ වසර 02 ක පළපුරුද්ද

**වයස :** අයදුම්පත් බාර ගන්නා අවසන් දිනට අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 30 ට නොවැඩි විය යුතුය.

**තෝරා ගැනීම :** ලිඛිත පරීක්ෂණයක් සහ සම්මුඛ පරීක්ෂණයක් මඟින්

**වැටුප් පරිමාණය :** UMN 1(III)
රු. 49,475 – 17 x 540 – 58,655/= (මාසික)

## **04.** පුස්තකාල තොරතුරු සහකාර III ශ්‍රේණිය

**අවශ්‍ය සුදුසුකම් :** 1. අ.පො.ස. (සා.පෙළ) විභාගයේ

i. සිංහල භාෂාව/ දෙමළ භාෂාව
ii. ඉංග්‍රීසි භාෂාව/ ඉංග්‍රීසි සාහිත්‍යය
iii. ගණිතය

යන විෂයයන්ට සම්මාන සාමාර්ථ සහිතව විෂයයන් හයක් එක් වරක දී සමත් වී තිබීම.

**සහ**

2. අ.පො.ස. (උ.පෙළ) විභාගය එක් වරක දී සියලු විෂයයන් සමත්වීම. (සාමාන්‍ය පොදු පරීක්ෂණ ප්‍රශ්න පත්‍රය හැර) (පැරණි විෂය නිර්දේශ යටතේ එක් වරක දී විෂයයන් තුනක් සමත් වී තිබීම ප්‍රමාණවත් වනු ඇත.)

**සහ**

❖ පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති අය කෙරෙහි ප්‍රමුඛතාවයක් දක්වනු ලැබේ.

(අ) පිළිගත් ආයතනයකින් ලබාගත් පුස්තකාල හා තොරතුරු විඥාපන විද්‍යා පාඨමාලාවේ ශිෂ්‍යභාවය හෝ අර්ධ / පූර්ණ සුදුසුකම්

**සහ**

(ආ) පිළිගත් ආයතනයකින් ලබා ගත් මාස හයකට (06) නොඅඩු පරිගණක යෙදුම් සම්බන්ධ පිළිගත හැකි සුදුසුකමක්

**වයස :** අයදුම්පත් බාර ගන්නා අවසන් දිනට අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

**තෝරා ගැනීම :** පරීක්ෂණයක් සහ සම්මුඛ පරීක්ෂණයක් මඟින්

**වැටුප් පරිමාණය :** UMN 1(III)
රු. 49,475 – 17 x 540 – 58,655/= (මාසික)

## 05. වැඩ සහායක III ශ්‍රේණිය

**අවශ්‍ය සුදුසුකම් :** අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගය දෙවරකට නොවැඩි වාර ගණනක දී අවම වශයෙන් සම්මාන සාමාර්ථයන් දෙකක් සහිතව විෂයයන් හයකට (06) නොඅඩු සංඛ්‍යාවක් සමග සමත්ව තිබිය යුතු ය.

**වයස :** අයදුම්පත් බාර ගන්නා අවසන් දිනට අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

**තෝරා ගැනීම :** වෘත්තීය පරික්ෂණයක් හා / හෝ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මඟින්

**වැටුප් පරිමාණය :** UPL 1 (III)
රු.42,775 – 16 x 450 – 49,975/= (මාසික)

**සටහන :** සෑම අයදුම්කරුවෙකුම;

(i) ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතු ය.

(ii) දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය ඉටු කිරීමට සහ තනතුරේ රාජකාරී හොඳින් ඉටු කිරීමට ශාරීරිකව හා මානසිකව යෝග්‍ය විය යුතුය.

(iii) යහපත් චරිතයකින් යුක්ත විය යුතු ය.

ඉහත මූලික වැටුපට අමතරව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව අනුමත කරන ලද අනෙකුත් දීමනා ද අදාළ රෙගුලාසිවලට අනුව ගෙවනු ලැබේ.

i. ජීවන වියදම් දීමනාව - රු.17,800.00
ii. MCA දීමනාව - මූලික වැටුපෙන් 36% - රු.330/=

**සේවා කොන්දේසි**

1. මෙය ස්ථිර තනතුරකි. පත්වීම් වසර තුනක (03) ක පරිවාස කාලයක් සඳහා යටත්වය.

2. තෝරාගත් අපේක්ෂකයින් දැනට රජයේ දෙපාර්තමේන්තුවක සේවය කරයි නම් ඔහුගේ / ඇයගේ අදාළ පත්වීම් අධිකාරිය හරහා තම නිදහස් කිරීම ලබා ගත යුතුය.

3. විශ්වවිද්‍යාල සේවයේ යෙදී සිටියදී රජයේ සේවකයින්ට ඔවුන්ගේ විශ්‍රාම වැටුප් අයිතිවාසිකම් පවත්වා ගැනීමට අයිතියක් නොමැත.

**ප්‍රතිලාභ**

1. තෝරාගත් අපේක්ෂකයින් තම ඉපයීම් වලින් සියයට දහයකට (10%) සමාන මුදලක් මාසිකව අඩු කිරීමෙන් විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලට දායක විය යුතු අතර ඊට අමතරව විශ්වවිද්‍යාලය තම අරමුදල්වලින් තම ඉපයීම්වලින් සියයට හතකට (07%) සමාන මුදලක් විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලට සහ තම ඉපයීම්වලින් සියයට අටකට (08%) සමාන මුදලක් විශ්‍රාම වැටුප් අරමුදලට දායක කරනු ඇත.

2. සේවක භාර අරමුදල ප්‍රතිපාදන අනුව විශ්වවිද්‍යාලය විසින් ඔහුගේ / ඇයගේ මූලික වැටුපෙන් සියයට තුනක් (03%) සේවක භාර අරමුදලට දායක කරනු ඇත.

**අයදුම්පත් ඉදිරිපත් කළයුතු ආකාරය**

www.sab.ac.lk /Vacancies යන විශ්වවිද්‍යාල වෙබ් අඩවියෙන් ''අයදුම්පත්'' බාගත කර ගත හැකිය.

රාජ්‍ය සේවයේ / සංස්ථා / ව්‍යවස්ථාපිත මණ්ඩලවල අයදුම්කරුවන් තම අයදුම්පත් අදාළ ප්‍රධානීන් හරහා ඉදිරිපත් කළ යුතුය. විශ්වවිද්‍යාල වෙබ් අඩවියෙන් බාගත කර ගන්නා ලද නිසි ලෙස සම්පූර්ණ කරන ලද අයදුම්පත්, උපාධි සහතික, වෘත්තීය සහතික ආදියෙහි සහතික කළ පිටපත් සමඟ **2025.04.25** දිනට හෝ ඊට පෙර **සහකාර ලේඛකාධිකාරි / අනධ්‍යයන ආයතන, ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය, තැ.පෙ. 02, බෙලිහුල්ඔය** යන ලිපිනයට ලැබෙන පරිදි ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ ඉල්ලුම් කරන තනතුර පැහැදිලිව සඳහන් කළ යුතුය. අයදුම්පත් යොමු කිරීම සම්බන්ධයෙන් අවශ්‍ය ඕනෑම ලිපි හුවමාරුවක් හෝ විමසීමක් සඳහා 0452280047 අංකය හරහා අප හා සම්බන්ධ විය හැකිය.

අවශ්‍ය විස්තර සඳහන් කර නොමැති හෝ අසම්පූර්ණ අයදුම්පත් හෝ ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් හෝ අනෙකුත් නියමිත අවශ්‍යතාවයන් සපුරා නොමැති අයදුම්පත් කිසිදු හේතුවක් නොදක්වා ප්‍රතික්ෂේප කරනු ලබන අතර, එවැනි අයදුම්පත් කිසිදු හේතුවක් නිසා යළි සලකා බලනු නොලැබේ.

ලේඛකාධිකාරි
ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය
2025.04.03